**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. ලොව වැඩිම පාසල් පිහිටා ඇති රට කුමක් ද?
   i. මෙක්සිකෝව ii. ඇමරිකාව iii. සිරියාව iv. ඉන්දුනීසියාව

02. යුනෙස්කෝ මූලස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
   i. ජපානය - ටෝකියෝ ii. ඉන්දියාව - නවදිල්ලි
   iii. ප්‍රංශයේ - පැරිස් iv. ඇමරිකාවේ - නිව්යෝර්ක්

03. ප්‍රථම වරට සාමාන්‍ය පෙළ විභාගය හා උසස් පෙළ විභාග දෙක විදේශයකදී පවත්වන ලද වසර දෙක හා රටවල් දෙක අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර කුමක් ද?
   i. 2006 - ඉන්දියාව, 2018 මැලේසියාව ii. 2007 - නේපාලය, 2018 ඕස්ට්‍රේලියාව
   iii. 2008 - මාලදිවයින, 2018 ඉන්දියාව iv. 2009 - බංග්ලාදේශය, 2018 මැලේසියාව

04. යුනිසෙෆ් මූලස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
   i. ඇමරිකාවේ - නිව්යෝර්ක් ii. ස්විස්ටර්ලන්තය - ජිනීවා
   iii. ඕස්ට්‍රේලියාව - සිඩ්නි iv. නේපාලය - කත්මන්ඩු

05. Knowledge Center පිහිටා ඇත්තේ කොහේ ද?
   i. මරදාන ii. මහරගම iii. මොරටුව iv. කලුබැද්ද

06. නුපුහුණු ගුරුවරුන්ගේ වෘත්තීය කුසලතා දියුණු කිරීම සඳහා වූ ගුරු විද්‍යාලයක නේවාසික පුහුණු කාලසීමාව වන්නේ,
   i. වසර 1යි ii. වසර 2යි iii. වසර 3යි iv. වසර 4යි

07. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වනු ලබන පාඨමාලා වර්ග ප්‍රමාණය කීය ද?
   i. 26 ii. 23 iii. 18 iv. 30

08. පාසල් ද්විතියිකයන් (06 - 13 ශ්‍රේණි) තුළ දිනකට ඉගැන්වීම සිදුකරනු ලබන පැය ගණන කීය ද?
   i. 05 ii. 06 iii. 04 iv. 07

09. පාසල් පාදක ඇගයීම 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා හඳුන්වා දුන් වර්ෂය කුමක් ද?
   i. 2002 ii. 2003 iii. 2004 iv. 2008

10. ශ්‍රී ලංකාවේ දහම් පාසල් දිනය යෙදී ඇත්තේ කවදාට ද?
   i. අගෝස්තු 03 ii. සැප්තැම්බර් 01 iii. ජූලි 07 iv. සැප්තැම්බර් 08

11. 01 ශ්‍රේණියට සිසුන් ඇතුළත්කර ගැනීමේදී සහෝදර ගණය යටතේ බඳවාගනු ලබන ශිෂ්‍යයින්ගේ ප්‍රතිශතය කීය ද?
   i. 15% ii. 30% iii. 25% iv. 10%

12. විද්‍යාව හා තාක්ෂණය ගමට ගෙනයාම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පිහිටුවා ඇති ආයතනය කුමක් ද?
   i. නැණසල ආයතනය ii. මහින්දෝදය තාක්ෂණාගාරය
   iii. විද්‍යා මධ්‍යස්ථානය iv. E - VILAGE

13. ළමා අධ්‍යාපනයේ පියා කවුරුන් ද?
   i. මාරි කියුරි ii. බේඩන් පවෙල් ස්වාමිවරයා
   iii. ෆෙඩ්රික් ෆොබෙල් iv. මාරි මියුසියස්

14. ශ්‍රී ලංකාවේ පළමුවන දහම් පාසල් ගුරු අභ්‍යාස විද්‍යාලය පිහිටුවා ඇත්තේ කොහේ ද?
   i. නුවරඑළිය - කොටගල ii. මහරගම - ගුරු අභ්‍යාස විද්‍යාලය
   iii. කඩවත - රන්මුතුගල iv. ගාල්ල - විජයානන්ද පිරිවෙන



Find out more details

15. ශ්‍රී ලංකාවේ පාසල් නිවැරදි අනුපිළිවෙලින් වර්ගීකරණය කර ඇත්තේ පහත සඳහන් කවරාකාරයෙන් ද?
i. 1A, 2B, 3C, 4, 5
ii. 1AB සුපිරි, 1AB, 1C, 2, 3
iii. 1AB, 1BC, 1, 3, 4
iv. 1AB සුපිරි, 2AB, 3C, 4, 5

16. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කරමින් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ඇති කළේ කුමන ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමය ද?
i. 1833 කෝල්බෲක් නිර්දේශ
ii. 1905 වේල්ස් කමිටු යෝජනා
iii. 1865 මෝගන් කොමිසම
iv. 1931 ඩොනමෝර් යෝජනා

17. විශේෂයෙන් වතුකරයේ ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පවත්වන අධ්‍යාපන විද්‍යාපීඨය පිහිටුවා ඇත්තේ කොහේ ද?
i. මුලතිව්
ii. හැටන්
iii. තලවකැලේ
iv. කොත්මලේ

18. විශ්වවිද්‍යාලවලින් බැහැරව උපාධි මට්ටම දක්වා ගුරුවරුන්ට අධ්‍යාපනය ලද හැකි රජයට සම්බන්ධ අධ්‍යාපන ආයතනය කුමක් ද?
i. ජාතික අධ්‍යාපන ආයතනය
ii. සාගර විශ්වවිද්‍යාලය
iii. අධ්‍යාපන දෙපාර්තමේන්තුව
iv. උසස් අධ්‍යාපන කොමිසම

19. උපකෘත පාසල් හා ගුරු විද්‍යාල අතිරේක විධිවිධාන පනත අනුව ආධාර ලබන පාසල් රජයට පවරාගත් අධ්‍යාපන ඇමතිවරයා කවුරුන් ද?
i. ඒ.ඊ.නුගවෙල මහතා
ii. රිචඩ් පතිරණ මහතා
iii. බදියුදීන් මහමුද් මහතා
iv. පී.බී.ජී.කළුගල්ල මහතා

20. සෑම පාසලකටම පොදු පාසල් ප්‍රජා සංවිධානය කුමක් ද?
i. කළමනාකරණ කමිටුව
ii. ගොඩනැගිලි ඉදිකිරීමේ කමිටුව
iii. පාසල් සංවර්ධන සමිතිය
iv. පංති කව

21. ළමා හා කාන්තා කාර්යාංශයේ කෙටි දුරකතන අංකය කුමක් ද?
i. 1938
ii. 1929
iii. 1956
iv. 1954

22. ඉංග්‍රීසි දැනුම සොයා බැලීමට කරන්නා වූ ජගත් පරීක්ෂණයේ නම කුමක් ද?
i. NORAD
ii. TOFEL
iii. OLIMPIAD
iv. KNOWLEDGE

23. සුරක්ෂා සිසුරක්ෂණාවරණය සැපයීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ 2017 සිට 2018 වසර දක්වා ගිවිසුම් ගතවී ඇති රක්ෂණ ආයතනය කුමක් ද?
i. ජනශක්ති රක්ෂණ සමාගම
ii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම
iii. සමුපාකාර රක්ෂණ සංස්ථාව
iv. AIA රක්ෂණ සමාගම

24. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක විශේෂවේදී උපාධි කාල පරාසය වන්නේ,
i. 3 - 4
ii. 4 - 5
iii. 5 - 6
iv. 6 - 7

25. දකුණු ආසියාවේ සාක්ෂරතාවය අතින් ශ්‍රී ලංකාවට හිමි ස්ථානය කීය ද?
i. 2
ii. 3
iii. 1
iv. 4

26. ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රථම ශ්‍රී ලාංකික උපකුලපතිවරයා කවුරුන් ද?
i. සී.ඩබ්.ඩබ්.කන්නංගර මහතා
ii. නිකලස් ආටිගල මහතා
iii. අයිවර් ජෙනිංග්ස් මහතා
iv. එල්.එල්.කේ.ගුණතුංග මහතා

27. මෙරට වෘත්තීය පුහුණුව සඳහා ස්ථාපිත විශ්වවිද්‍යාලය කුමක් ද?
i. මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලය
ii. වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලය
iii. වෘත්තීය පුහුණු අධිකාරිය
iv. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය

28. ගුරු අධ්‍යාපනඥ සේවයේ නියුක්ත වූවන්ගේ සේවා ස්ථානය කුමක් ද?
i. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
ii. ගුරු මධ්‍යස්ථානය
iii. ගුරු අභ්‍යාස විද්‍යාලය
iv. විවෘත විශ්වවිද්‍යාලය



Find out more details

29. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදුකළ වර්ෂයක් නොවන්නේ මින් කුමන වර්ෂය ද?
   i. 1939  ii. 1981  iii. 1979  iv. 1932

30. තාක්‍ෂණවේදය සඳහා උපාධිය ලබාදෙන විශ්වවිද්‍යාලය කුමක් ද?
   i. මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලය  ii. ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරිය
   iii. වෘත්තීය තාක්‍ෂණ විශ්වවිද්‍යාලය  iv. කාර්මික විද්‍යාලය

**✱ ප්‍රශ්න අංක 31 සිට අංක 50 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

31. 1985 වන විට මෙරට හඳුනාගෙන ඇති ජාතික පාසල් ප්‍රමාණය කීය ද?

.................................................................................................................................................

32. උපාධි නොලත් ගුරුවරුන්ට ගුරු පුහුණුව ලබාදීම සඳහා පවතින විද්‍යාල විශේෂය කුමක් ද?

.................................................................................................................................................

33. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මකවන විශ්වවිද්‍යාලය කුමක් ද? ..............................

34. සේවාස්ථ ගුරු පුහුණුව සඳහා පාඨමාලා පවත්වනු ලබන ස්ථාන හඳුන්වන ලබන නම කුමක් ද?

.................................................................................................................................................

35. ගුරු සම්පත් මධ්‍යස්ථාන අධීක්‍ෂණය හා සුපරීක්‍ෂණය කරනු ලබන ආයතනය කුමක් ද?

.................................................................................................................................................

36. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනයට විදේශ ආධාර හා ණය පහසුකම් ලබාදෙන ආයතන 03ක් සඳහන් කරන්න.

.................................................................................................................................................

37. ජාතික ඒකාබද්ධතාවය ඇති කිරීම උදෙසා ද්විභාෂා දරුවන් බිහිකිරීමට සිංහල ළමයින්ට දෙමළ හා දෙමළ ළමයින්ට සිංහල ඉගැන්වීම ආරම්භ කරනු ලබන්නේ කීවෙනි ශ්‍රේණියේ සිට ද?

.................................................................................................................................................

38. 5 වසර ශිෂ්‍යයත්ව පරීක්‍ෂණය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු දෙක මොනවා ද?

.................................................................................................................................................

39. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීම සඳහා අවසර නොමැති විෂයන් දෙක මොනවා ද?

.................................................................................................................................................

40. මෙරට ශිෂ්‍යයෙකුට අ.පො.ස.උසස් පෙළ සඳහා පෙනී සිටිය හැකි ප්‍රධාන විෂය ධාරා 04 මොනවා ද?

.................................................................................................................................................

41. මුදල් ගෙවා අධ්‍යාපනය ලැබීමට නොහැකි මෙරට දරුවන් වෙනුවෙන් නොමිලේ අධ්‍යාපනය ලැබීම සඳහා පුණ්‍ය පාඨශාලා ආරම්භ කරන ලද්දේ කුමන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාගේ පාලන සමය තුළ ද?

.................................................................................................................................................

42. මොනිටර් ක්‍රමය හෙවත් දක්‍ෂ ශිෂ්‍යයින් ලවා අනෙකුත් ශිෂ්‍යයින්ට ඉගැන්වීම ආරම්භ කළ ආණ්ඩුකාරවරයා කවුරුන් ද ?

.................................................................................................................................................

43. කොළඹ ඇකඩමිය ආරම්භය, මධ්‍යම පාසල් පිහිටුවීම, මධ්‍යම පාසල් කොමිසම ඇරඹීම, දේශීය විභාග ක්‍රමය ඇතිකිරීම, රජයෙන් ආධාර දීමේ පාසල් ඇතිකිරීම ආදිය සිදුකල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවු ද?

.................................................................................................................................................

44. පාසලේ ස්ථාවර භාණ්ඩ පිළිබඳව සටහන් තබනු ලබන පොත කුමක් ද? ..............................

45. ගුරු සංවර්ධන සඳහා පිහිටුවා ඇති **SBTB** වැඩසටහන යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමන වැඩසටහන ද?

.................................................................................................................................................

46. ලංකාවේ ගුරු දිනය ඔක්තෝම්බර් 06 දින සැමරීමට ප්‍රධාන හේතුව කුමක් ද?

.................................................................................................................................................

47. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සේවා කොමිසන් සභාවේ ප්‍රථම සභාපතිවරයා කවු ද? ..............................

48. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ කුමන පාලන සමයක ද? ..............................

49. ශ්‍රී ලංකාවේ ප්‍රථම විභාග කොමසාරිස්වරයා කවු ද? ..............................

50. ශ්‍රී ලංකාවට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හඳුන්වා දුන්නේ, ..............................



Find out more details